සන්නස
SANNASA




# වවුනියාව පොලිසියේ සිරමැදිරිය තුළ විශ්‍රමය

**සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න**

දහනව වන දින සවස් වන විට එම ස්ථානයට ගෙන එන ලද බස් රථයකට මාව නැංවීය. ඒ වන විටත් සටන්කාමී පිරිමි සාමාජිකයන් බොහෝ දෙනෙක් බස් රථය තුළ උන්හ. බස්රථය ඕමන්තේ පසුකොට වවුනියාව දක්වා ගමනාරම්භ කළේය. සිවිල් ඇඳුමින් සැරසුණු සී.අයි.ඩී. නිලධාරීන් දෙදෙනෙකු එම වාහනයෙහි උන්හ. ඔවුහු මා දෙස බලමින් ද සිංහලෙන් කතා බහ කරමින් ද උන්හ. වේගයෙන් ගමන් කළ බස් රථය ගස් බහුල ස්ථානයක නතර කෙරිණි. සියලු දෙනාම බස් රථයෙන් බස්සවා ගොඩනැගිල්ලක් තුළට කැඳවාගෙන ගියහ. කම්බි කූරුවලින් සකස් කළ සිර කුඩු සහිත ශාලාවක් පසු කරමින් මම ගමන් කළෙමි. එහි උන් කීප දෙනෙක් මගේ නම පවසා මට අඬ ගැසූහ. මම වේගයෙන් ගමන් කරමින් සිටි හෙයින් ඔවුන් දෙස හැරී බැලීමට මට හැකි වූයේ නැත. බිමට නැඹුරු කරගත් හිසින් යුතුව මම ඔවුන්ව පසුකරගෙන ගියෙමි. මා සමඟ කැඳවාගෙන ආ පිරිමි සටන්කාමීන්ව වෙනත් මාර්ගයකින් කැඳවාගෙන ගියා විය හැකිය. මාව පමණක් තනිවම කාර්යාලයට කැඳවා ගෙන ගියේය.

සාමාන්‍ය ඇඳුමින් සිටි බුද්ධි අංශයෙහි නිලධාරීහු රැස්ව උන් කාර්යාලයීය කාමරයකට මා කැඳවා ගෙන ගියහ. පෝස්ටරයක් තරම් විශාල පත්‍රිකාවක් එක් නිලධාරියෙක් මට දුන්නේය. එහි සංවිධානයෙහි නායකතුමා ඇතුළු සියලුම සෙන්පතිවරුන්ගේ සහ වගකීම් භාර අයගේ ඡායාරූප මුද්‍රණය කර තිබුණි. ඒවා මත විවිධ සළකුණු තබා තිබුණි. එහි වූ මගේ ඡායාරූපය ඔහු පෙන්නුවේය. ඉරි සහිත නිල ඇඳුමක්, තොප්පියක් පැළඳ සිටි මගේ ඡායාරූපය මත ප්‍රශ්නාර්ථ සළකුණ ලකුණු කර තිබුණි.

නිලධාරීහු බොහෝ දෙනෙක් මගෙන් සිංහලෙන් සහ දෙමළෙන් බොහෝ ප්‍රශ්න ඇසූහ. සිංහල ටිකක්වත් නොතේරුණු හෙයින් මම නිහඬව උන්නෙමි. එයට පසුව දෙමළ දන්නා නිලධාරියෙක් මා සමඟ කතා කළේය.

"ඔයාලගේ නායක ප්‍රභාකරන්ට මොකක්ද සිද්ධ වුණේ?"

"සෙන්පතිවරුන්ගෙන් සමහරු මැරුණා. අනෙක් අයට මොනවද වුණේ?"

"අන්තිම වතාවට නායකතුමා දැක්කේ කවදාද?"

"ඔයා කොහොමද ඇතුළට ආවේ?"

යනාදී වශයෙන් ප්‍රශ්න ගණනාවක් මගෙන් ඇසුවේය. ඔහුගේ කිසිම ප්‍රශ්නයකට පැහැදිලි පිළිතුරක් දීමේ හැකියාව මා තුළ තිබුණේ නැත. මක්නිසාද යත් අවසන් දින කීපය තුළ කිසිම කෙනෙකුගේ සම්බන්ධතාවක් මට තිබුණේ නැති බැවිනි. නිලධාරීහු තමන් අතරේ කුමක්දෝ සිංහලෙන් කතාබහ කරන්නට වූහ. පසුව මාව කැඳවාගෙන යන ලෙස දැනුම් දුන්හ.

රාත්‍රී ආහාර පාර්සලයක් සමඟ කුඩා වතුර බෝතලයක් මට ලබාදුන් අතර එතැන වූ පුටුවේ ඉඳගෙන කෑම කන ලෙස ඔවුහු පැවසූහ. එක කටක් කෑමට පවා හැකි මානසික මට්ටමක මම ඒ මොහොතේ සිටියේ නැත. පසුව කන බව පවසා මම කෑම පාර්සලය ලබා ගත්තෙමි. අපව කැඳවාගෙන පැමිණි එම බස් රථයේම නැවතත් අපව නංවා වවුනියාව පොලිස් ස්ථානයට කැඳවා ගෙන ගියේය. එහිදී පොලිස් නිලධාරීහු විස්තර ලියා ගත්හ. එයට පසුව කාන්තා රැඳවියන් සිටින කුඩා කම්බි කූඩුවක් තුළ මා රැඳවීය. ඒ වන විටත් කාන්තාවෝ තිදෙනෙක් එහි උන්හ. එහි මැදිරි ආරක්ෂක වූ වයසක සිංහල කාන්තාවක් සිමෙන්ති බංකුවක නිදාගෙන උන්නාය.

මම මගේ ජීවිතයෙහි පළමු වතාවට සිර මැදිරියක රැඳවීමකට ලක් වූයෙමි. නිදාගැනීමට සූදානම්ව උන් එම කාන්තාවෝ මටත් ඉඩක් දුන්හ. මගේ නඩුව කුමක්දැයි ඔවුහු විමසූහ. මම "එල්.ටී.ටී.ඊ" යැයි කීවෙමි. "කොහෙදිද ඇල්ලීවේ?" යැයි ඇසූහ.

"කොහොමටත් ඔයාව කොළඹ එක්කරගෙන ගිහින් තමයි ප්‍රශ්න කරන්නේ. මම ගිය වතාවේ මෙහෙට ආපු වෙලාවෙත් එක ගෑනු ළමයෙක් ඊළඟ දවසෙම කොළඹ ගෙනිච්චා. හොඳ ලෝයර් කෙනෙක් ඇල්ලුවා නම් හරි. නඩු කියලා හරි එළියට එන්න පුළුවන්." යැයි මට උපදෙස් දෙන්නට වූහ.

සාමාන්‍ය ගැමි කාන්තාවන් වන මේ අය මේ තරම් හොඳින් නීතිමය ක්‍රියාමාර්ග දැනගෙන සිටීමත්, නිතර නිතර පොලිස් කූඩුවට පැමිණ යාමත් පුරුද්දක්ව පැවතින බව සිතීම පවා පුදුමයක් විය. වන්නියේ යුද්ධයක් කෙරෙනවා යන්න මිස ඒ වන විට එහි තත්ත්වය පිළිබඳව කිසිවක් එම කාන්තාවෝ දැන සිටියේ නැත. ඔවුහු නිදහස් වූ වහාම තම සතුරන්ගෙන් පලිගත යුතු ආකාරය පිළිබඳව දරුණු වචනවලින් කතාබහ කරමින් උන්හ. ඔවුන්ගේ කතාබහට අනුව ඔවුන් පැමිණ සිටින්නේ අඬ දබර කිරීම් සහ නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය ආශ්‍රිත නඩුවලට චූදිතයන් වී බව අවබෝධ විය. එම රෑ කාලයෙහි පවා ඔවුහු කට පුරා බුලත් හපමින් උන්හ.

ගතද සිතද වෙහෙසට පත්ව තිබූ එම තත්ත්වය තුළ මම බිත්තියට හේත්තු වී ඉඳගෙන උන්නෙමි. නිදිමත දරාගත නොහැකිව ඇස් පියවෙන්නට වුවත්, තැතිගැන්ම සහ හිතේ තිගැස්ම මා නින්දට නොයවා අවදිව තබා ගැනීමට හේතු විය.

මධ්‍යම රාත්‍රිය පසුවූ මොහොතක එක් වරම මහත් ශබ්දයකින් යුතුව දොර විවර විය. තවත් කාන්තාවන් තිදෙනෙකු රැගෙන විත් ඇතුළට දමා ගියහ. දොර නැවතත් වැසුණි. එහි ගෙනැවිත් සිටි අය දුටු වහාම මම තැගැස්මට ලක් වූයෙමි. ඔවුන් මා හොඳින් දන්නා අයයි. සෝදියා බලකායේ පරිපාලන අංශයේ ඔවුහු කටයුතු කළහ.

"ඔයාලව පුනරුත්ථාපන මධ්‍යස්ථානයට නේද යැව්වේ? ඇයි මෙහෙට ගෙනාවේ?"

යැයි මම ඇසුවෙමි. එම ස්ථානයට පිරිස දහස් ගණනින් පැමිණෙමින් සිටින බවත්, සමහර අය අතර අඬදබර ඇති වන බවත්, එවැනි අවස්ථාවක තමන් එම ප්‍රශ්නය විසඳීමට මැදිහත් වූ මොහොතේ අනිවාර්යා බඳවා ගැනීමට ලක්වූ යුවතියක් බැණ වැදී පහර දීමට පැමිණි බවත්, එයින් ප්‍රශ්නය තවත් උග්‍ර වූ බවත්, ඒ ගැන දැනගත් හමුදාව තමන්ව මෙම ස්ථානයට ගෙන ආ බවත් ඔවුහු පැවසූහ. මෙයට පසුව තමන්ට කුමක් සිදුවිය හැකිද යන කැලඹිලි සහගත බවින් ඔවුහු පසු වූහ.

අළුයම කෑම සඳහා සිරමැදිරිය භාර කාන්තාව විසින් දෙදෙනා බැගින් කැඳවාගෙන යන ලදි. ඇය විසින් පවසන ලද කාල සීමාව තුළ එකම එක ජල කරාමයකින් එන වතුර ස්වල්පයක් නා මා සතුව පැවැති එකම ඇඳුම මාරු කර ගත්තෙමි. බත් සහ සම්බල් සහිත කෑම පාර්සලයක් දහවල් ආහාරය සඳහා ලැබුණි.

පෙර දින දුන් කෑම පාර්සලය කුණු කූඩයට දමන විට මා තුළ ඇතිවූයේ මහත් සිත් වේදනාවකි.

මුල්ලිවෙයික්කාල්වලදී ජනතාව කැඳ උගුරක් වෙනුවෙන් දිඟු පෝලිමක සිටි අවස්ථා මගේ මතකය තුළ හොල්මන් කරන්නට විය.

කුසගින්න විසින් ආහාර ගැනීමට මා උනන්දු කරවනු ලැබුවත්, හිතේ පීඩනය උගුරු දණ්ඩ සිරකරගෙන තිබුණි. එයින් එක බත් පිඩක්වත් උගුරෙන් පහළට යාමට සමත් වූයේ නැත. ටික වේලාවකින් සෝදියා බලකායේ කාන්තා සෙබළියන් තමන්ව වෙනත් පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට කැඳවාගෙන යන බව පැවසූහ.

